# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1659/22 - 2010 ජුනි මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2010.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ ගාල්ල මහ නගර සභාවේ සභිකයකුගේ ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

පක්ෂ සාමාජිකත්වය අහෝසිවීම හේතු කොටගෙන ගාල්ල මහ නගර සභාවේ සභිකයකුගේ ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අජිත සරත්චන්ද්‍ර ඩී. සරත් ගුණරත්න නම් වූ සභිකයා අයත්වන එක්සත් ජාතික පක්ෂය නම් වූ, පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත්කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ ගාල්ල මහ නගර සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තෙකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තෙකු වන නිමල් චන්ද්‍ර රණසිංහ මහතා, ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

ගාල්ල මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, නිමල් චන්ද්‍ර රණසිංහ මහතා ගාල්ල මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,
තේරීම්භාර නිලධාරි,
ගාල්ල මහ නගර සභාව.

2010 ජුනි මස 15 වැනි දින,
ගාල්ල,
මැතිවරණ කාර්යාලයේ දී ය,

07-296

1A - G 13027— 345 (2010/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.